**බිබිල ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 15 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 29 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට බිබිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

(අ) <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ කඩකුලී ආදායම රු.132,000 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ගිණුම්ගත කිරීමට නොහැකි වූ බවද 2020 වර්ෂයේදී ගිණුම සකසන විට නිවැරදි කරන බව දන්වමි. |
| (ii) | සභාවට අයත් ඉඩම් 5 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂයේදී ගිණුම් සකසන විට නිවැරදි කරන බව දන්වමි. |

**1.4 <u>අනුකූල නොවීම්</u>**

**<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

**2. <u>මූල්‍ය සමාලෝචනය</u>**

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභාපනත** | | | |
| (i) 19(1)(xii) වගන්තිය | සභාවට අයත් බහුකාර්ය ගොඩනැගිල්ල වසර 15 කට බදු දීමේදී අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රධාන අමාත්‍යවරයාගේ අනුමැතිය මේ වනතෙක් ලැබී නොමැති බව දන්වමි. |
| (ii) 139 වගන්තිය | වරිපනම් බදු පැනවීමකට යටත් දේපලවල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවා නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී වාර වාර්තා කැඳවන බව දන්වමි. |
| (iii) 158,162 හා 163 වගන්ති | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 5,434,653 ක හිඟ වරිපනම් බදු අයකරගෙන නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී දේපල තහනමට ගෙන හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 වගන්තිය | ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාර 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් ඉදිරිපත් කර ඇති කළමනාකරණ විගණන වාර්තාව සඳහා ප්‍රතිචාර දක්වා නොතිබුණි. | කළමනාකරණ විගණන වාර්තාවේ නිර්දේශවලට මාස 3 ක් ඇතුළත පිළිතුරු ලබාදිය යුතුවේ. | අතපසුවීමකින් පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව දන්වමි. |
| (ඇ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය | 2014,2015 හා 2016 වර්ෂවල දී අනුමත කර තිබුණු ගොඩනැගිලි සැලසුම් 64 කට අදාලව අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | ඉදිකිරීම් භෞතිකව පරීක්ෂාකර ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | අනුකූලතා සහතික ලබා නොගත් පාර්ශවයන් වෙත ලිඛිතව දැනුම් දී ඇති බව දන්වමි. |

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 22,090,344 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 32,267,729 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්පත් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,468,650 | 8,761,099 | 6,830,215 | 1,930,884 | 5,924,975 | 6,412,936 | 4,192,378 | 2,220,558 |
| (ii) | කුලී | 17,930,530 | 13,973,243 | 12,590,068 | 1,383,175 | 12,142,338 | 11,609,839 | 9,262,937 | 2,346,902 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,550,500 | 1,789,648 | 1,789,648 | - | 250,000 | 350,220 | 350,220 | - |
| (iv) | වෙනත් ආදායම් | 21,047,500 | 24,747,690 | 18,251,694 | 6,495,996 | 205,000 | 1,181,148 | 1,181,148 | - |
| | එකතුව | 48,997,180 | 49,271,680 | 39,461,625 | 9,810,055 | 18,522,313 | 19,554,143 | 14,986,683 | 4,567,460 |

**2.2.2 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **වරිපනම් බදු** | | |
| (i) වරිපනම් බදු අය කිරීමට සුදුසු ප්‍රදේශ සභාව විසින් 1990 වර්ෂයේදී හඳුනාගෙන තිබුණු අතර, කලින් කළ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට සභාවේ අවධානය යොමුකර නොතිබුණි. | කලින් කළ දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන ඒ අනුව වරිපනම් ප්‍රදේශ සංශෝධනය කළ යුතුවේ. | දියුණු කළ ප්‍රදේශ පුළුල්කර ගැනීම සඳහා සභා අනුමැතියට ඉදිරිපත් කර ඇති බව දන්වමි. |
| (ii) සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු. 3,163,819 ක් වූ වරිපනම් බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු. 1,434,772 ක් රැස්කර නොතිබුණු අතර එය මුළු බිල් කළ වටිනාකමින් සියයට 45 ක් විය. මෙම | හිඟ වරිපනම් අයකරගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| හිඟ වරිපනම් බදු තුල රු.10,000ට වැඩි හිඟ වරිපනම් බදු ඒකක 65 ක් වූ අතර ඒවායින් අයවිය යුතු හිඟ මුදල රු.1,195,168 ක් විය. | | |
| (iii) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී පැවති රු. 5,160,699 ක් වූ හිඟ වරිපනම් බදු ආදායමින් වර්ෂය තුලදී රු. 3,999,881 ක් අයකරගෙන නොතිබුණි. එම අය නොකල මුදල වර්ෂය ආරම්භයේ පැවති හිඟ වරිපනම් මුදලින් සියයට 77 ක් විය. | හිඟ වරිපනම් අයකරගත යුතුවේ. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමි. |

**2.2.3** <u>කුලී</u>

<u>හිඟ දේපල බදු ආදායම්</u>

| | | |
|---|---|---|
| සභාවට අයත් දේපල 9 කින් අයවිය යුතු රු. 1,184,013 ක බදු මුදල් අයකරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල් අයකර ගත යුතුවේ. | හිඟ බදු මුදල් අයකර ගැනීමට නඩු පවරා ඇති බව දන්වමි. |

**2.2.4** <u>ස්ථාවර වෙළඳ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ සභා බලප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණු දැන්වීම් පුවරු 35 ක් වෙනුවෙන් අයවිය යුතු රු. 96,150 ක දැන්වීම් පුවරු ගාස්තු අයකරගෙන නොතිබුණි. | ආදායම් පරික්ෂක නිලධාරීන් විසින් සමීක්ෂණ සිදුකර දැන්වීම් පුවරු හඳුනාගෙන ගාස්තු අයකරගත යුතුවේ. | 2019 වර්ෂයේදී ගාස්තු අයකරගත නොහැකි වූ අතර 2020 වර්ෂයේදී ගාස්තු අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.5** <u>ජල ගාස්තු ආදායම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂ 1 කට වැඩි කාලයක සිට අයනොවී පවතින රු. 613,490 ක් වූ හිඟ ජල ගාස්තු අයකර නොතිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුවේ. | 2020 මැයි 30 දිනට රු. 348,003 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.2.6** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| -------------------------- | ------------- | ------------------ |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු. 1,463,383 ක් සහ හිඟ මුද්දර ගාස්තු රු. 5,510,893 ක් අයකර නොතිබුණි. | හිඟ උසාවි දඩ මුදල් සහ හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ මුදලින් රු. 886,232 ක් සහ හිඟ මුද්දර ගාස්තුවලින් රු. 1,681,134 ක් අයවී ඇති බව දන්වමි. |

**3.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** <u>අතුරු ව්‍යවස්ථා</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| -------------------------- | ------------- | ------------------ |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් ඉන් කාරණා 06 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | කාරණා 3 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් සකස් කර පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට යවා ඇති අතර අනෙක් කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කරමින් පවතින බව දන්වමි. |

**(ආ)** <u>තිරසර සංවර්ධනය</u>

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| -------------------------- | ------------- | ------------------ |
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟාකර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | ඉලක්ක හා දර්ශක හඳුනාගෙන ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

**3.2** <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 07 කට අදාලව සිටි සේවක අතිරික්තය 16 ක් සහ තනතුරු 5 කට අදාලව සේවක පුරප්පාඩු 5ක් පැවතුණි. | අතිරික්ත කාර්යමණ්ඩලය විධිමත්කර ගැනීම හා පුරප්පාඩු පුරවාගත යුතුවේ. | 2013 ජනවාරි 01 දිනට අනුමත කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් බඳවාගත් අතර නව තනතුරු සඳහා සාධාරණීකරන වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව දන්වමි. පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. |

**3.3** <u>වත්කම් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| <u>මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන නොකිරීම</u> | | |
| සභාවේ පවත්වාගෙන යනු ලබන මාර්ග ඉන්වෙන්ට්‍රිය 2012 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය යාවත්කාලීන කළ යුතුවේ. | ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති අතර ඉදිරියේදී සුදුසු වැඩ පිළිවෙලක් සකස් කරන බව දන්වමි. |

**3.4** <u>වාහන උපයෝජනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් යන්ත්‍රෝපකරණ 02 ක් 2019 ජනවාරි 01 සිට 2019 අගෝස්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුලදී මීටර් පැය 1,486.53 ක් ධාවනය කර, කර්මාන්ත 257 ක් ඉටුකළ බව දෛනික ධාවන සටහන්වල දක්වා ඒ සඳහා රු. 1,208,211 ක ඉන්ධන වියදමක් දරා තිබුණද එම කර්මාන්තවලට අදාලව ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල කර නොතිබුණි. | ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල කළ යුතුවේ. | එක් කාර්මික නිලධාරියෙකු පමණක් සිටින බැවින් ඇස්තමේන්තු සහ නිමි වැඩ වාර්තා පිළියෙල කළ නොහැකි වූ බව දන්වමි. |

**4.** <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

**4.1** <u>අභ්‍යන්තර විගණනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුවේ. | 2019 වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදු නොකළ බවද, 2020 වර්ෂයේදී සිදුකරන බව දන්වමි. |

**4.2** <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | සභාව තුල විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | 2019 වර්ෂයේදී කමිටු නොපැවැත්වූ බවද, 2020 වර්ෂයේදී පවත්වන බව දන්වමි. |